www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**හැඳින්වීමේ සටහන්:**

# ධනවාදී අර්බුදය සහ ආර්ථික "ප්‍රකෘතිවීම"

**Introductory remarks: On the capitalist crisis and the economic "recovery"**

**ජෝ කිෂෝර් විසිනි**

**2010 අප්‍රේල් 23**

*"රැකියා සඳහා හදිසි වැඩ පිලිවෙලක්! බැංකු ජනසතු කිරීම සහ ධනය යලි බෙදීම සඳහා!" යන මැයෙන් සමාජ අර්බුදය සහ යුද්ධයත්, පලමු යෝජනාවත්, ගැන සසප / ලෝසවෙඅ හදිසි සම්මේලනයට හඳුන්වාදීම සඳහා සමාජවාදී සමානතා පක්ෂයේ ජාතික ලේකම් ජෝෂප් කිෂෝර් විසින් මෙම වාර්තාව ඉදිරිපත් කරන ලදී.*

සමාජ අර්බුදය සහ යුද්ධය පිලිබඳ සසප / ලෝසවෙඅ හදිසි සම්මේලනය කැඳවනු ලැබුවේ ලෝක ධනවාදී පද්ධතියේ ගැඹුරු වෙමින් පවතින අර්බුදකාරී තත්වයන් යටතේ ය. "ප්‍රකෘති වීම" පිලිබඳ කථා තිබිය දී ම, වසර එකහමාරකට පෙරාතුව 2008 සැප්තැම්බර් මස පුපුරා මතු වූ අර්බුදය, අදටත් අපට ප්‍රබල ලෙස බලපායි. සැබවින්ම, අප දැන් නව අවධියකට ඇතුල් වී ඇති අතර, මෙම නව අවධිය සමග කම්කරු පන්තිය මත එල්ල වන ප්‍රහාර වැඩි දියුනු වීමත්, ඒ සමගම ඔවුන්ගේ වෛරය සහ විරෝධය උග්‍රවී තීව්‍ර වෙමින් පවතී.

එලඹෙමින් තිබෙන ඉදිරි දින දෙක තුල අප ඉදිරියේ තීරනාත්මක කර්තව්‍යයක් ඇත. අපගේ යෝජනා මාලාවේ අරමුන වන්නේ ඇමරිකාව තුලත් ජාත්‍යන්තරවත් කම්කරු පන්තිය මුහුන දෙන බැරෑරුම් කාරනා මාලාවක් සාකච්ඡා කිරීමය; එනම් ගැඹුරු වන සමාජ අර්බුදයත්, අතිමහත් විරැකියාව මගින් මතු කරනු ලැබ ඇති ව්‍යසනයත්, සෞඛ්‍ය පහසුකම්, විශ්‍රාම වැටුප් සහ අධ්‍යාපනය මතට එල්ල කරන ප්‍රහාර හා මෘග යුද්ධවල අඛන්ඩ පැවැත්මත මානව සංහතිය සම්බන්ධයෙන් සත්‍ය වශයෙන්ම විනාශකාරී ඇඟවුම් සහිත පුලුල් ගැටුමක අනතුරක් මතුවීම ගැනය.

අප විශිෂ්ට ආර්ථික ප්‍රකෘති වීම මධ්‍යයේ ජීවත් වන බව, මාධ්‍යයන්ට ඇහුම්කම් දෙන යමෙකුට හැඟෙනු ඇත. මෑතම නිකුත් වූ නිව්ස් වීක් සඟරාව " ඇමරිකාවේ පුනරාගමනය" ගැන ප්‍රකාශ කලේය. එහි සිරස්තලය වූයේ "අපගේ ආර්ථිකය ප්‍රකෘතිමත්වීම ගැන කැපීපෙනෙන සාකච්ඡාව"ය.

1929 කොටස් වෙලඳපොල බිඳවැටීමෙන් පසුව සහ අවපාතය මහත් ජවයකින් ක්‍රියාත්මක වීමට පෙරාතුව එවන් ප්‍රකාශයන් වඩා හොඳින් කල හැකිව තිබෙන්නට ඇත."ඇමරිකානු ආර්ථිකයේ දීර්ඝ කාලීන පසු බැසීම බොහෝසෙයින් අතිශයෝක්තියට නන්වනු ලැබ ඇත. කිසිදු කෙනෙකු බලාපොරොත්තු වූවාට වඩා එහි ප්‍රතිමල්ලවයින් බහුතරයකට වඩා වේගයෙන් ශක්තිමත්ව ද වඩා හොඳින් සහ වේගයෙන් ඇමරිකාව යලි ප්‍රකෘතිමත් වෙමින් තිබේ." යනුවෙන් නිව්ස් වීක් සඟරාව ප්‍රකාශ කලේය.

නිව්යෝක් ටයිම්ස් සඟරාවේ ආර්ථික විද්‍යාව පිලිබඳ ලේඛක ෆ්ලොයිඩ් නොරිස් ආර්ථික පුනර්ජීවනයේ සංඥාවන් පැහැදිලිව ඉස්මතු වී ඇති බවට තර්ක කරමින් ඔහුගේ මෑත තීරු ලිපියක දී "ඇයි මෙච්චර කලකිරී සිටින්නේ" යනුවෙන් ප්‍රශ්න කලේය. "විවේක ගන්න, අප සෞඛ්‍යමත් ව සිටිමු" යන ශීර්ෂ පාඨය යටතේ ටයිම්ස් සඟරාවේ වෙනත් තීරුවක ඩේවිඩ් බෘක්ස් සලකුනු කරන්නේ ඇමරිකානුවන් සියයට 60 සිතන්නේ රට වැරදි දිශාවකට ගමන් කරන බව ය. "කනස්සල්ල සඳහා හේතු රාශියක් පවතින" නමුත් ඔහුගේ කොලම "නැවුම් බවින් පිරිපුන් උත්සන්නියක්" බව ඔහුම පවසයි. "ගැටලු සියල්ල තිබියදීම, ඇමරිකාවේ අනාගතය බොහෝ සෙයින් දීප්තිමත්" බව බෘක්ස් කියයි. මෙම සර්වශුභවාදය වැඩිමනත් අද්භූතයක් ලෙස පෙනෙයි. අවම වශයෙන් වසරක් සඳහා ඩොලර් 100,000 වඩා ඇමරිකානුවන්ගෙන් සියයට 60 ක් පසුගිය දශකය තුල ඉපැයූ බව බෘක්ස් තම කොලම තුල විකාරී ලෙස කියා පායි.

දිනපතා පදනමක් මත අප සියලු දෙනා දකින යථාර්ථය සමග මෙම ප්‍රකෘතිමත්වීමේ ප්‍රකාශනයන් අප සසඳන්නේ කෙසේද? මෙම කාමරයේ සිටින කී දෙනෙක් බෘක්ගේ සාරදර්ශනයේ ආකර්ශනීය උත්සන්නිය විසින් ග්‍රහනයට ගනු ලැබ ඇත්ද? මහා පරිමාන විරැකියාවේ, වැටුප් පහත වැටීමේ, පාසැල් විනාශවීමේ, පහසුකම් මත එල්ල කරන ප්‍රහාර එනම් අනාගතය කෙරෙහි බියකරු අවිනිශ්චිතතාවයක විපාක

මිලියන සංඛ්‍යාත ජනතාව දෛනික පදනමක අත්දකිමින් සිටිති. ඇමරිකාව තුලත්, ජාත්‍යන්තරවත් දැවැන්ත යුද විරෝධය තිබියදීම, අවසානයකින් තොරව යුද්ධය දිගටම කෙරීගෙන යයි. 2007 බුෂ්ගේ ඉදිරි තල්ලුවේ කූටප්‍රාප්තියේ අවධියට වඩා ඔබාමා යටතේ දැන් විදේශ රටවල ඇමරිකානු හමුදා බොහොමයක් යොදවනු ලැබ සිටිති. එක්සත් ජනපදය ඇෆ්ගනිස්ථානය තුල ලේ වැකි ප්‍රහාරයක් මුදාහැර ඇත.

යථාර්ථය පිලිබඳ මෙම එකිනෙකට පරස්පර අර්ථ විවරනයන් දෙක පිටුපස එකිනෙකට විරුද්ධ හා සමහන් කල නොහැකි අවශ්‍යතාවන් දෙකක් පවතී.

සමහරෙකුට තැති ගැනීම සඳහා හොඳ හේතු ඇත. පසුගිය සතියේ බැංකු ලාභාංශ වර්ධනය වීම ගැන වාර්තා පලවිය.

තම නව ආයෝජන පාලිත සමාගම වන මෙරිල් ලින්ච් වෙතින් ලැබුනු ඉතා විශාල ආදායම් වල පිහිටෙන් බැන්ක් ඔෆ් ඇමරිකා මෙම වසරේ පලමු කාර්තුව තුල ඩොලර් බිලියන 3.2 ක ලාභයක් වාර්තා කලේය. මෙරිල් ලින්ච් භූගෝලීය කොටස් වෙලඳපොලවල විශාල වශයෙන් සිදුකල ගනුදෙනු මගින් ඇ.ඩො. බිලියන 3.2 ආදායමක් ඉපයීය. වෙනත් වචනවලින් කිවහොත්, බිලියන සංඛ්‍යාත ඇපදීම් මුදල් ලබාගත් බැන්ක් ඔෆ් ඇමරිකා වෙලඳපොල සමපේක්ෂන තුලින් යලි ජීවමාන බවට පත් කරනු ලැබ ඇත.

පසුගිය වසර තුල සියයට 55 වර්ධනයක් සහිතව පලමු කාර්තුවේදී ඇ.ඩො.බිලියන 3.3 ජේ.පී. මෝර්ගන් චේස් සමාගම විසින් උපයාගැනීම ඉහත ආකාරයේම කතන්දරයක් ලෙස කෙනෙකුට පෙනෙනු ඇත. නැවතත් මෙම ලාභ වලින් වැඩි කොටසක් උපයා ගනුලැබුවේ වෙලඳපොල ගනුදෙනු මගින් ය.

ඔබට මුදල් තිබුනානම් - ඔබාමා පරිපාලනය විසින් සැබවින්ම නොමිලයේ මුදල් ලබා දීම නිසා බැංකුවලට අති මහත් මුදල් තිබින - සහ පසුගිය වසර පුරා ඔබ එය වෙලඳ පොලේ ආයෝජනය කලානම්, ජයපැන් බීමට බොහෝ දේවල් ඇත. ඇමරිකාවේ ප්‍රධාන හෙජ් මූල්‍ය කලමනාකරුවන් 25 දෙනා ඩොලර් බිලියන 25 කට වඩා ගෙදර ගෙනගියහ. එනම් එක් අයෙකුට හිමිවූ කොටස දල වශයෙන් බිලියනකට වැඩිවිය. ඔවුන් එසේ කලේ වටිනාකමක් නිර්මානය කිරීමෙන් නොව, සමපේක්ෂනය මගින් ම පමනි.

එහෙත් එය සාමාන්‍ය ජනතාව සඳහා ජීවන කොන්දේසිවල පුනර්ජීවනයක් සලකුනු කිරීමක් නොවේ. වෙලඳපොල වර්ධනය අත් කර ගන්නේ සූරා කෑම දැවැන්තව තීව්‍ර කිරීමක් මත පාදකවය. කොටස් වටිනාකම්වල වැඩිවීම නියෝජනය කරන්නේ ඔට්ටු ඇල්ලීමකි. එනම් දැවැන්ත වියදම් කප්පාදු ද ඵලදායකත්වය ඉහල දැමීමෙන් ද වැටුප් අඩු කිරීමෙන් හා ඔබාමාගේ සෞඛ්‍ය ප්‍රතිසංකරන වලට පිංසිදුවන්නට සෞඛ්‍ය පහසුකම් කප්පාදු කිරීම මගින් ද ඔට්ටු අල්ලන්නෙකුට එනම් සංගතවලට ලාභ ගැරීමට හැකිවනු ඇත.

"ඇයි මෙච්චර කලකිරී සිටින්නේ" යන තම ලිපියේ අවසානයේ දී දැනට පවතින තත්වය 1980 දශකයේ මුල් කාලය සමග ෆොලොයිඩ් නොරිස් සංසන්දනය කිරීම සැලකිය යුතු කරුනකි. ඔහු තර්ක කරන්නේ එම කාලයේ මෙන්ම ආර්ථිකය ප්‍රකෘතිමත්වීමට ලක ලැහැස්ති වී බලා සිටින බවය.

සැබවින්ම, රීගන් පරිපාලනයේ කාල පරිච්ඡේදයේදී එනම්, 1980 දශකයේදී කම්කරු පන්තියට ක්ෂමා විරහිතව ප්‍රහාරවලට ගොදුරු වීමට සිදු විය. එම දශකය පුරා ගෙන යන ලද වැටුප් කප්පාදුව සහ රැකියා විනාශය කල්පවත්නා ප්‍රතිවිපාක ඇති කලේ ය. ඩෙට්‍රොයිට් වැනි නගර විනාශයට ඇද දමමින් ද කාර්මිකහරනයේ දීර්ඝ කාල පරිච්ඡේදයක් සමග සමපාත වෙමින් ද ඇමරිකාවේ මූල්‍ය අංශයේ අති මහත් බලය වර්ධනයවීමේ ආරම්භය ද මෙය විය.

ඒ හා සමාන ප්‍රහාරයක් වඩා ඉහල පරිමානයකින් දැනටමත් සූදානම් කෙරෙමින් පවතී. පාලක පන්තිය කම්කරු පන්තියේ ජීවන තත්වයයන්හි විනාශකාරී ලෙස පහල දැමීමක් ක්‍රියාත්මක කරමින් සිටියි.

කම්කරු පන්තියේ ජාත්‍යන්තර එකමුතුව යන යෝජනාව පෙන්වා දී ඇති පරිදි, ලෝකයේ සෑම තැනකම කැඳවුම් කෙරෙන්නේ පටිතදකර ගැනීම සඳහාත්, පරිභෝජනය සහ වැටුප් අඩු කිරීමටත්, ඊනියා "සුබල්ලිකානු පැවැත්ම" අවසන් කරන ලෙස ය. කම්කරුවෝ අවශ්‍ය පහසුකම්වලින් තොරව ජීවත්වෙති. අතීතයේ දී දිනාගත් වරප්‍රසාද තව දුරටත් සරලවම ලබාගත නොහැකිය. ග්‍රීසිය, පෘතුගාලය, සහ ස්පාඤ්ඤය, ජර්මනිය සහ බ්‍රිතාන්‍යයේත් ඔස්ට්‍රේලියාව සහ ජපානයේත්, ශ්‍රී ලංකාව සහ ඉන්දියාවේත් අයවැය කපා හැරීම් දිනපතා න්‍යාය පත්‍රයට ඇතුලත් කර තිබේ.

මෙහි එනම් ඇමරිකාවේ, මාධ්‍යය සහ දේශපාලන සංස්ථාපිතයෙන් ගලා එන ආදර්ශ වාක්‍ය වන්නේ සියලුදෙනාම පටි තද කරගැනීම සහ වියදම් කපා හැරීම වෙත අවධානය යොමු කිරීමය. ඔබාමාගේ සෞඛ්‍ය ප්‍රතිසංස්කරනය ලෙස වංචනිකව ඉදිරිපත් කල නෛතික ලියවිල්ලේ කේන්ද්‍රීය තේමාව මෙයයි.

දක්ෂිනාංශික වියදම් කපා හරින්නන් කිහිප දෙනෙකු අයවැය පරතරය පියවීමේ ද්වීපාර්ශ්වීය මන්ඩලයට පත් කිරීමේදී ජනාධිපති ඉල්ලා සිටියේ "ඉතා දීර්ඝ කාලයක් සඳහා අපගේ ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා අවශ්‍ය කරන දෘඩ තෝරාගැනීම් චොෂින්ටනය මග හැර තිබුන බවය." 'දෘඩ'

තෝරාගැනීම එනම් සමාජ රක්ෂණයන් සහ සෞඛ්‍ය පහසුකම්වල සැලකිය යුතු කප්පාදුවකි.

"හිමිකම් වර්ධනය වැලැක්වීම" ජාතික ආරක්ෂාව සඳහා මූලික කාරනාවක් වන බව හමුදා මූලෝපායික කන්ඩායමක් මෑතකදී ප්‍රකාශ කලේ ය.

මෑත නිව්යෝක් ටයිම්ස් සඟරාවේ තීරුවක දී වෘත්තීමය සෝෂා බද්දෙක් වූ තෝමස් ෆ්‍රීඩ්මන් වඩා අශිෂ්ට ලෙස ලිව්වේ: "අප ඇමරිකාවේ වසර 70ක් පුරා පුෂ්ටිමත් වී ඇත්තෙමු. පසුගිය වසර 70 පුරා නායකත්වය බොහෝසෙයින් කලේ දේවල් ප්‍රදානය කිරීමයි. දැන් දැනෙන්නට පටන් ගෙන තිබෙන්නේ ආන්ඩුවලත් නායකත්වයේත් ශ්‍රේෂ්ඨ කර්තව්‍යය වන්නේ මහජනයාගෙන් දේවල් යලි ලබා ගන්නා නව කාල පරිච්ඡේදයකට අප ඇතුල්වෙමින් සිටින බවය."

පසුගිය දශක ගනනාව පුරා ෆ්‍රීඩ්මන් මහතා තර වූ අතර කම්කරු පන්තියේ අත්දැකීම වන්නේ හාත්පසින් ම වෙනස් එකකි. ආර්ථික අර්බුදයේත් බැංකු ඇප දීම් වලත් මුලු බර ඔවුන්ගේ උර මත පතිත කරන විට මිලියන සංඛ්‍යාත කම්කරුවන් මුහුන පාන සමාජ අර්බුදය වඩා දරුනු වීමට නියමිත ය.

දැනටමත් තත්වය අන්තයටම විනාශකාරීය. නිල වශයෙන් විරැකියාව සියයට 9.7 වුව ද ඇත්තෙන්ම එය ඊට වැඩිය. විරැකියානුවන්ගෙන් සියයට 44 ක් එනම්, මිලියන 6.5 වැඩි ජනතාවක් මාස 6 වැඩි කාලයක් විරැකියාවේ සිට ඇත. මහා අවපාතයෙන් පසු මෙය ඉහලම රේට්ටුවය. රටේ සමහර අංශවල ආර්ථික ක්‍රියාවලිය මුලුමනින්ම ඇනහිට තිබේ. ඩෙට්‍රොයිට් හි, සැබෑ විරැකියාව සියයට 50 පමන වන්නේය. රටේ ප්‍රාන්තවලත් නගරවලත්, පාසැල් වසා දමනු ලබන අතර රැකියා කප්පාදු කිරීම් සමග ගුරුවරුන් සහ ආන්ඩුවේ කම්කරුවන්ට වැටුප් සහ සේවා කොන්දේසි කප්පාදුව ද පිලිගැනීමට බල කරනු ලැබ ඇත.

ක්‍රියාත්මක කරනු ලැබ ඇති මෙන්ම සැලසුම් කෙරෙමින් තිබෙන කප්පාදු කිහිපයක්, තැනින් තැන උපුටා ගතහොත් පහත සඳහන් පරිදි වේ:

කන්සාස් නගරයේ, ගුරුවරුන් 300 නෙරපා හරිමින් පාසැල් 61කින් අඩකට ආසන්නව වසා දැමීම සඳහා පාසැල් දිස්ත්‍රික් පරිපාලනය මෑතදී අනුමැතිය පලකලේය. පසුගිය සතියේ මිසෝරි සෙනේටය කේ - 12 සහ උසස් අධ්‍යාපනය තුල විශාල ලෙස කප්පාදු කිරීම් හරහා යෝජිත අයවැයෙන් ඩොලර් මිලියන 506ක් කප්පාදු කලේය.

ඇලබාමාවේ මොන්ගොමෙරි හි, රාජ්‍ය පාසැල් මන්ඩලය මෙම මාසයේ දී සේවක කප්පාදුවේ ප්‍රථම අදියර තුලදී ගුරුවරුන් 415 ඇතුලු සේවකයින් 600 ක් නෙරපා දැමීමට අනුමැතිය දුන්නේ ය.

චිකාගෝ උපනගරවල, පාසැල් මන්ඩලය පසුගිය සතියේ ඩොලර් මිලියන 44 ඉතිරි කිරීම සඳහා ගුරුවරුන් 700 ක් ඇතුලුව කම්කරුවන් 1000 ක් නෙරපා දැමීම අනුමත කලේය. ඩොලර් බිලියන 1.3 ක් ඉතිරි කිරීම සඳහා ප්‍රාන්තය පුරා සියයට 17 ක් දක්වා අයවැය කප්පාදු කිරීමට ඉලිනොයිස් නගරය තුල සැලසුම් කරමින් සිටියි.

පසුගිය වසර 2 පුරා අති මූලික සමාජ වැඩපිලිවෙලවල් සඳහා ප්‍රහාර දියත් කරමින් අයවැය කප්පාදු කිරීම් මාලාවක් සම්මත කරනු ලැබූ කැලිෆෝර්නියා ප්‍රාන්තය එවන් කප්පාදු කිරීම් තව තවත් සැලසුම් කරමින් පවතියි. කැලිෆෝර්නියා පාසැල් දිස්ත්‍රික් පරිපාලනය පසුගිය මස 22,000 ගුරුවරුන් සහ පරිපාලකයින් නෙරපාදැමීමේ මූලික දැන්වීම් නිකුත් කලේය.

මෙහි එනම් ඩෙට්‍රොයිට් හි, පුරපති ඩේවිඩ් බින්ග් සහ රාජ්‍ය පාසැල් හදිසි මූල්‍ය කලමනාකාර රොබර්ට් බොබ් තව දුසිම් ගනනක් පාසැල් වසා දැමීමටත්, නගරයේ මහා පරිමාන සේවාවන් කප්පාදුවකටත් සහයෝගයෙන් කටයුතු කරමින් සිටිති. වැඩිපුර රැකියා කප්පාදු සහිතව නාගරික කම්කරුවන් සඳහා තවදුරටත් වැටුප් කප්පාදු කිරීමට බින්ග් ඉල්ලා සිටියි.

නමුත් දුර්මුඛ නොවන ලෙස අපට කියනු ලබයි. සාරදර්ශනයට පාලනය කිරීමට ඉඩ දෙන්න!

ඒ සමගම 2008 සැප්තැම්බර් මස මූල්‍ය දියවීයාම නිර්මානය කල කිසිදු තත්වයක් විසඳනු ලැබ නැත. සමපේක්ෂනය නැවතත් වර්ධනය වෙමින් පවතී. දීර්ඝ කාලීන කර්මාන්ත බිඳ වැටීමත් සමග බද්ධ වී මූල්‍ය වංශාධිපතීන්ගේ අත්වල දැවැන්ත ලෙස සංකේන්ද්‍රනය වූ ධනස්කන්දය මහත් අන්තයන්ටම වර්ධනය වී තිබේ. භූගෝලීය අසමතුලිතතාවන් සහ ජාතික ආතතීන් ගැඹුරු වී ඇත. යුරෝපීය අර්බුදය තවත් නය අර්බුදයකට පරිවර්තනය වීමේ අනතුරක් ජනිත කර ඇත. මෙයට රාජ්‍ය නය ද ඇතුලත් කර ගනිමින් තිබේ.

එලඹෙන මාස කිහිපය තුල ඉතා ශුභවාදීව සලකන කල්හි, කම්කරු පන්තියේ ජීවන තත්වයන් නොනැවතී හෝදාපාලු වීමට නියමිත අතර නරකම තතු තුල 2008 සැප්තැම්බර් අර්බුදය සමග සංසන්දනය කල නොහැකි ආකාරයේ තවත් මූල්‍ය කලබැගෑනියක් සිදු වනු ඇත.

මෙම සම්මේලනය කැඳවනු ලැබ ඇත්තේ සමාජ අර්බුදය සහ යුද්ධයට ප්‍රතිචාරයක් ලෙසය. මෙම දෙකෙහිම අත්‍යවශ්‍ය සබඳතාවය මතුවීම මා බලාපොරොත්තු වන එක් තේමාවකි. ඇමරිකාවේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය තීරනය කරන්නේ කුමන අවශ්‍යතාවන් ද එම අවශ්‍යතාවන් විසින් ම එහි විදේශ ප්‍රතිපත්තිය ද තීරනය කරනු ලබයි.

ආර්ථික අර්බුදයට ප්‍රතිචාරය ලෙස, ඇමරිකානු සංගත ප්‍රභූව, එක් අතකින්, එක්සත් ජනපදයේ කම්කරු පන්තියට බරට කර ගැසීමට බලකරමින්, අනෙක් අතට තම ප්‍රතිමල්ලවයන්ගේ කර මතට බර මාරු කිරීම සඳහාත් උත්සාහ කරමින් සිටිති.

යුද්ධය පිලිබඳ යෝජනාව සාකච්ඡාව තුලදී මෙම ප්‍රශ්නය ගැන අපට වැඩිමනත් පැවසීමට ඇති නමුත්, මෙතන දී මම යමක් ගැන සටහන් කිරීමට කැමත්තෙමි. එනම් යුද්ධය අවසන් කරනවා වෙනුවට ඇත්තෙන්ම ඔබාමා පරිපාලනය එය උත්සන්න කර ඇත. එය ඉරානයට එරෙහි නව තර්ජන එල්ල කරමින් සිටියි. වෙලඳ ගැටුම් දක්වාත්, අවසාන වශයෙන් හමුදා ගැටුමක් දක්වාත් තර්ජන එල්ල කරන ආතතීන් වලින් ඇමරිකානු සහ චීන සබඳතා පිරී ඇත. ඒ සමගම විනාශකාරී මෘගත්වයන් ඇති කල 20වන සියවසේ යුද්ධ දෙකක් සඳහා මුල් වූ ආතතීන් එනම් මහාද්වීපයේ අන්තර් ගැටුම් යුරෝපය පුරා හඹායමින් තිබෙන රාජ්‍ය නය අර්බුදය අති මහත් ලෙස තීව්‍ර කර ඇත.

තත්වය සත්‍ය වශයෙන් ම, අවදානම් අවස්ථාවකි. කම්කරු පන්තිය ප්‍රතිචාර දක්වන්නේ කෙසේ ද? විසඳුම කුමක් ද? ඔබාමා පරිපාලනය යම් දෙයක් ප්‍රදර්ශනය කර ඇත්නම්, එහි අර්ථය වන්නේ එය පවතින දේශපාලන පද්ධතිය තුල වෙනස් කල නොහැකි බව ය. ප්‍රතිපත්තිවල සෑම මූලිකාංගයක්ම සම්බන්ධයෙන්ම ගත්කල එනම් - යුද්ධය ව්‍යාප්ත කිරීමේ සිට, බැංකු ඇපදීම්, පොදු අධ්‍යාපනය සහ සෞඛ්‍ය පහසුකම් මත ප්‍රහාර, විරැකියා ප්‍රශ්නයට ආමන්ත්‍රනය කරන රැකියා වැඩ පිලිවෙලක් ඇති කිරීම ප්‍රතික්ෂේප කිරීම - ඔබාමා ඇමරිකානු පාලක පන්තියේ අවශ්‍යතාවන් ආරක්ෂා කර ඇත.

මෙම යෝජනා තුලදී, අප තර්ක කරන්නේ ධනවාදී සිද්ධිදාමයට එනම් - කම්කරු පන්තියේ ජීවන කොන්දේසි විනාශයට ඇද දමන හා යුද්ධය අනිවාර්ය කරන - එකම විකල්පය සමාජවාදී විසඳුම බව ය. එනම්, පුද්ගලික ලාභය නොව සමාජ අවශ්‍යතාවයන් සන්තර්පනය කිරීම සඳහා ලෝක ආර්ථිකය පරිවර්තනය කිරීමය. දේශපාලන තත්වය මාරුවෙමින් පවතී. ඇත්ත වශයෙන්ම බෘෂ් මහත්මයාගේ සුභවාදයෙන් වෙනස් වූව ද අපට සර්වශුභවාදයක් ඇත. අපට කම්කරු පන්තියේ සටන්කාමී ශක්තිය පිලිබඳව ශ්‍රේෂ්ඨ සර්වශුභවාදයක් තිබේ.

දැනටමත්, ජාත්‍යන්තරව කම්කරු පන්තියේ වර්ධනය වෙමින් පවතින විරෝධයේ සංඥාවන් මතුවෙමින් පවතී. මෑත මාසවල යුරෝපය තුල මහා වැඩ වර්ජන සහ උද්ඝෝෂන පැවතින. මෙහි, එනම් ඇමරිකාව තුල රජයේ අධ්‍යාපනය මත එල්ල කරන ප්‍රහාරයන්ට එරෙහිව විරෝධතා පුපුරා ගියේය. බටහිර වර්ජිනියාවේ පතල් අනතුරෙන් පසුව මතු වූ මහජනවෛරය කැකෑරෙමින් පවතින කෝපයට සාක්ෂි දරයි.

ඩෙට්‍රොයිට් නගරයේ මහජන සේවාවන් කපා හැරීමට එරෙහි අපගේ උද්ඝෝෂනයට කම්කරු පන්තියේ කොටසකගේ බලගතු ප්‍රතිචාරයක් ලැබී තිබේ. ඔවුහු දශක ගනනාවක් පුරා සිදු වූ ආර්ථික පසු බැසීමත්, කාර්මිකහරනයත් මගින් ජනිත වූ අර්බුදයේ විනාශකාරී විපාක අත් දකිමින් සිටිති.

අද උදෑසන *ලෝ.ස.වෙඅ* බැලීමට අවස්ථාවක් නොලද ඔබ අතරින් කෙනෙකු ඇත්නම් සිල්වියා යන්ග් නොතකා හැරීමේ වරදට ගොදුරු කිරීමේ වෑයම ඊයේ අධිකරනයක් මගින් නිශ්ප්‍රභා කිරීම ගැන ඇසුවහොත් ඔබ සතුටු වන බව මට සහතිකයි. එය ඇයට එරෙහිව එල්ල කෙරුනු ව්‍යාජ උද්ඝෝෂනයේ මුලුමනින්ම වංචා සහගත ස්වභාවය ප්‍රදර්ශනය කරන වැදගත් ජයග්‍රහනයකි. ඒ කෙසේ වෙතත්, අද උදෑසන *ලොසවේඅ* යේ පලකරන ලද සම්මුඛ සාකච්ඡාවේ දී සිල්වියා පැවසුවේ, "දැන් සටන ආරම්භ වූවා පමනි" යන්න ය. එය ආරම්භ වූවා පමනි. ඩෙට්‍රොයිට් අභ්‍යන්තර නගරය සහ යප්සිලන්ති වල පාසල් කාමරවල සිට බටහිර වර්ජිනියාවේ ගල් අඟුරු ආකර දක්වා, ඇමරිකාවේ සිට ග්‍රීසිය, චීනය, සහ ඔස්ට්‍රේලියාව, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව දක්වා. ලෝකය පුරාම කම්කරු පන්තිය සටන් සඳහා ප්‍රයත්න දරමින් සිටිති. තීරනාත්මක අවශ්‍යතාවය වන්නේ ලොව පුරා කම්කරු පන්තිය ඒකාබද්ධ කිරීම සහ අර්බුදයේ මූලය වන ධනවාදී පද්ධතිය ට එරෙහිව මෙම අරගල යොමු කිරීමත් ය.

මේ සියල්ලටමත් වඩා අවශ්‍ය වන්නේ කම්කරු පන්තියට ස්වාධීන නායකත්වයක්, දේශපාලන වැඩපිලිවෙලක් සහ ඉදිරිදර්ශනයකි. මෙයයි සමාජවාදී සමානතා පක්ෂයේත් මෙම සම්මේලනයේත් අරමුන. අප හැරෙන්නට කිසිදු කෙනෙක් මෙම නායකත්වය සපයන්නේ නැත. වෘත්තීය සමිති ඉතා දැඩි ලෙස සංගතවල ව්‍යුහය තුලට අවශෝෂනය වී ඇත. මධ්‍යම පන්තියේ විශාල පදාසයක් ඩිමොක්‍රටික් පක්ෂයටත් ලිබරල් සංස්ථාපිතයටත් තමන් බැඳ තබනු ලැබ ඇති දහසක් නූල්පට වලින් සම්මුති ගස්සනු ලැබ ඇත. තම වැඩපිලිවෙලේදීත්, ඉදිරිදර්ශනය සහ ඉතිහාසය තුලදීත්, සසප නියෝජනය කරන්නේ කම්කරු පන්තියේ වෛෂයික අවශ්‍යතාවයයි. ඉදිරි දින දෙක තුලදී අපි කම්කරු පන්තිය මුහුන දෙන මූලික ක්‍රියාමාර්ගික ගැටලු කිහිපයක් ආමන්ත්‍රනය කරන යෝජනා මාලාවක් සාකච්ඡා කරන්නෙමු. මෙම සම්මේලයෙන් පිටත අප කම්කරු පන්තියට දේශපාලන ඉදිරි දර්ශනයක් මෙන්ම නායකත්වයක් සම්පාදනය කිරීමේ සටන ඉදිරියට ගෙන යා යුතු ය.

ඒ කාරනාව අවධාරනය කිරීමත් සමග මම පලමු යෝජනාව ගැන සාකච්ඡාව ආරම්භ කිරීමට කැමැත්තෙමි.

© www.wsws.org